මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
Elections Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

මාධ්‍ය නිවේදන අංක : **LAE/2025/11** **2025.03.12**

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025

### තැපැල් ඡන්ද ඉල්ලුම් කිරීම.

**තැපෑලෙන් ඡන්දය ප්‍රකාශ කිරීමට අපේක්ෂා කරන ඒ සඳහා සුදුසුකම්ලත් රජයේ නිලධාරීන්/ ආරක්ෂක අංශ නිලධාරීන් හා තැපැල් ඡන්ද සහතික කිරීමේ නිලධාරීන් වෙත කරනු ලබන නිවේදනයයි**

2025 මාර්තු මස 12 දින මධ්‍යම රාත්‍රී 12.00න් අවසන් වීමට නියමිතව තිබූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීමට අදාළ තැපැල් ඡන්ද අයදුම්පත්‍ර භාර ගැනීමේ දිනය, තැපෑලේ දී සිදුවිය හැකි ප්‍රමාදවීම් සහ කොමිෂන් සභාව වෙත කරනු ලැබූ ඉල්ලීම් සැලකිල්ලට ගෙන **2025 මාර්තු මස 17 (සඳුදා) දින මධ්‍යම රාත්‍රී 12.00 දක්වා දීර්ඝ කළ බව මෙයින් නිවේදනය කරමි.** ඒ අනුව, අයදුම්පත්‍ර භාර ගැනීමේ අවසන් දිනයේ දී එනම්, 2025 **මාර්තු මස 17 (සඳුදා)** දින දින මධ්‍යම රාත්‍රී 12.00ට පෙර ඒවා අදාළ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාල වෙත ලැබිය යුතු වේ.

**අයදුම්පත්‍ර ලැබීමේ දී සිදුවිය හැකි ප්‍රමාදය වලක්වා ගැනීම සඳහා 2025 මාර්තු මස 13 දින සිට 17 දින දක්වා කාලය තුළ සම්පූර්ණ කරන තැපැල් ඡන්ද අයදුම්පත්‍ර තැපෑලට භාර දීමෙන් වැළකී ඒවා එක් එක් දිස්ත්‍රික් අනුව වෙන්කර වෙන වෙනම කවරවල බහා සහතික කිරීමේ නිලධාරී කාර්යාලය පිහිටි දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයට අතින් ගෙනවිත් භාර දීමට කටයුතු කිරීම වඩාත් යෝග්‍ය බව දන්වා සිටිමි.**

**එසේම 2025.03.10 දින නාමයෝජනා දැන්වීම පළ කළ කිළිනොච්චිය දිස්ත්‍රික්කයේ පූනාකරි ප්‍රාදේශීය සභාව, මන්නාරම දිස්ත්‍රික්කයේ මන්නාරම ප්‍රාදේශීය සභාව හා අම්පාර දිස්ත්‍රික්කයේ දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව යන පළාත් පාලන ආයතනවල පමණක්, තැපැල් ඡන්ද අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනය 2025.03.19 බව වැඩිදුරටත් දන්වා සිටිමි.**

**කිසිදු හේතුවක් මත මෙම දින නැවත දීර්ඝ නොකරනු ලබන බව ද සැලකුව මැනවි.**

සමන් ශ්‍රී රත්නායක
මැතිවරණ කොමසාරිස් ජනරාල්